**ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල (ජීඑෆ්ඒටීඑම්) ව්‍යාපෘතියේ මැලේරියාව 8 වන වටය සංරචකය 2012**

----------------------------------------------------------------------------------------------------------

1. **මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 3 ජේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම හැර මාගේ මතය වනුයේ,

(අ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ

(ඈ) ප්‍රදාන ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

2. **මූල්‍ය ප්‍රකාශන**

2.1 **මූල්‍ය කාර්යසාධනය**

මූල්‍ය ප්‍රකාශන සහ ලබාගත හැකිවූ තොරතුරු අනුව,සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.195,880,756ක් වූ අතර 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතයේ සමුච්චිත වියදම රු.915,807,280 ක් විය. සමාලෝචිත වර්ෂයෙ වියදම, ඉකුත් වර්ෂයේ වියදම හා 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| අයිතමය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2012 | 2011 | |
| | රු | රු. | රු. |
| දේපල, පිරියත හා උපකරණ | 26,021,667 | 23,011,831 | 83,496,826 |
| මැලේරියා මර්දන කටයුතු | 169,859,089 | 592,235,828 | 832,310,454 |
| | 195,880,756 | 615,247,659 | 915,807,280 |

**2.2** <u>මුදල් ප්‍රවාහ ප්‍රකාශය</u>

2011 සහ 2012 වර්ෂ සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පිළියෙල කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ තත්ත්වය පහත සඳහන් පරිදි වේ.

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | |
|---|---|---|
| | **2012** | **2011** |
| | රු. | රු. |
| **මෙහෙයුම් කටයුතුවල මුදල් ප්‍රවාහය**<br>විදේශ ආධාර ප්‍රදානවලින් ලැබුණු මුදල් (වැය -13) | 185,000,000 | 664,427,415 |
| ටෙන්ඩර් ආදායම්වලින් ලැබුණු මුදල් | 14,000 | 68,435 |
| වැඩ සටහන් වියදම සඳහා ගෙවන ලද මුදල් | (169,859,089) | (592,235,828) |
| දෙන ලද අත්තිකාරම් (ශුද්ධ) | 41,205,573 | 45,291,618 |
| ගෙවීම් වැඩිවීම් (රඳවා ගැනීමේ බද්ද සහ රඳවා ගැනීම්) | (80,403) | (1,066,109) |
| මෙහෙයුම් කටයුතවල ශුද්ධ මුදල් ප්‍රවාහය | 56,282,081 | 28,034,513 |
| **ආයෝජන කටයුතවල යොදන ලද මුදල් ප්‍රවාහය** | | |
| ස්ථාවර වත්කම් | (26,021,668) | (23,011,831) |
| ආපසු ගෙවන තැන්පතු - ලාච්චු | (40,000) | - |
| ආයෝජන කටයුතවල යොදන ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | (26,061,668) | (23,011,831) |
| **මූල්‍ය කටයුතුවල මුදල් ප්‍රවාහය** | | |
| අමාත්‍යාංශයට (භාණ්ඩාගාරයට ) මුදල් ආපසු යැවීම | <u>(30,220,413)</u> | <u>(5,022,682)</u> |
| | (56,282,081) | (28,034,513) |

**3.** <u>**විගණන නිරීක්ෂණ**</u>

**3.1** <u>**ගිණුම්කරණ අඩුපාඩු**</u>

(i) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 අනුව රු.1,285,650ක් වූ රඳවාගැනීමේ මුදල් සඳහා විස්තරයක් මූල්‍ය ප්‍රකාශනවලට ගිණුම් සටහනක් ලෙස ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 2012 වර්ෂයේදි මිලදී ගන්නා ලද රු.6,544,142 ක් වූ ස්ථාවර වත්කම් ගිණුම්වලට ගෙන නොතිබුණි.

## 3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2006- ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙ 8.9.3 වගන්තිය | රු. 500,000 ඉක්මවා රු.9,142,542ක් වටිනා උපකරණ මිලදී ගැනීම් අවස්ථා 6 ක් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුම් වලට එළඹ නොතිබුණි. |
| (ආ) | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛ | |
| | (i) 2008 අප්‍රේල් 24 දිනැති අංක පීඑෆ්/එෆ්එස්/01/ xxxv | රු.62,800ක් වූ ගුවන් ටිකට්පත් පුද්ගලික ආයතනයකින් මිලට ගෙන තිබූ අතර ඒ සඳහා රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| | ( ii ) 2007 අගෝස්තු 07 දිනැති අංක MOFA/ERD/2007/02 | මූල්‍ය ප්‍රකාශන ඊළඟ වර්ෂයේ මාර්තු 31 හෝ ඊට පෙර විගණනයට ඉදිරිපත් කළයුතු වුවද , සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන (මැලේරියා 8 වන වටය) විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2013 ජුනි 25 දිනදීය. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | මැලේරියා මර්දන කටයුතු සඳහා ව්‍යාපෘතිය මගින් මිලදීගන්නා ලද පරිගණක හා ඊට අදාළ මෘදුකාංග සම්බන්ධව ස්ථාවර වත්කම් ලේඛනයක් ව්‍යාපෘතිය මගින් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඈ) | මුදල් රෙගුලාසි | |
| | ( i) 371 (2) (ඇ) | ලබාගන්නා ලද අත්තිකාරම් ගනුදෙනු සිදුකළ වහාම නිරවුල් කළ යුතු වුවද අවස්ථා 26 කදී එකතුව රු.2,095,540ක් වූ අත්තිකාරම් පියවීමට මාස 6කට වැඩි කාලයක් ගතවී තිබුණි. |

| | |
|---|---|
| ( ii ) 756 | රු. 85,196,210ක් වටිනාකම වූ ස්ථාවර වත්කම්වලට අදාළව භෞතික සත්‍යාපනය කර නොතිබුණි. |

## 3.3. කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| අයිතමය | වටිනාකම | විස්තරය |
|---|---|---|
| ----- | ------ | ------- |
| | රු. | |
| (අ) මදුරු කීටයන් පාලනය කිරීම සඳහා මැලේරියා මර්දන ව්‍යාපාරය හා වයඹ විශ්ව විද්‍යාලය අතර ඇති කරගත් ගිවිසුම | 1,416,000 | ව්‍යාපෘති කාලය 2011 ජුනි සිට මාස 12 ක් වුවද, 2013 අප්‍රේල් දක්වාම ව්‍යාපෘතිය අවසන් කර නොතිබුණි. |
| (ආ) අත්තිකාරම් ලබාදීම | 416,365 | විධිමත් පරිදි වියදම් පුරෝකථනය නොකිරීම නිසා අවස්ථා 18 කදී ලබා දුන් අත්තිකාරම්වලින් රු.416,365 ක් සැලකිය යුතු කාල ප්‍රමාදයකින් පස මුදලින් පියවා තිබුණි. |
| | 91,200 | අවස්ථා 04 කදී ලබාදුන් අත්තිකාරම් මුදල් අදාළ කාර්යයට නොයොදවා මාස 01 ත් 04 ත අතර කාල පරාසයකට පසුව නැවත පියවා තිබුණි. |
| (ඇ) පුහුණු වැඩසටහන් | 7,315,495 | 2012 වර්ෂයේ පුහුණු වැඩසටහන් සඳහා වෙන්කල රු.7,315,495 ක මුදලින් , වර්ෂය තුළදී උපයෝජනය කර තිබුණේ රු.3,945,162ක් පමණි. |

## 3.4. විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන විෂයය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොවීම හේතුවෙන් එම විෂයය විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

| විෂයය | වටිනාකම | ලබාගත නොහැකි වූ සාක්ෂි |
|---|---|---|
| ------- | ----- | ----------------------------- |
| | රු. | |
| (අ) පාරිභෝජ්‍ය ද්‍රව්‍ය මිලට ගැනීම | 548,250 | (i) මිලදීගන්නා ලද භාණ්ඩවල විස්තර<br>(ii) ඉන්වොයිසි<br>(iii) නියමිත පිරිවිතරයන්ට අනුකලව භාණ්ඩ බාරගත් බවට සහතික |
| (ආ) සම්පත්දායක දීමනා | 300,000 | ගෙවීමට අදාළ පාර්ශවයන්ගේ විධිමත් අනුමැතිය හා තහවුරු කර ගැනමේ ලියවිලි |

## 3.5. හඳුනාගත් අලාභ

එකක් රු.3.75 බැගින් වු රුධිර විදින කටු 150,000 මිලදි ගැනිම සඳහා සැපයුම්කරුවෙකු තෝරා ගෙන තිබූණු අතර 2013 මැයි 15 වන විට ඇණවුම යවා තිබුණි.ඇණවුම යැවීමට වු ප්‍රමාදය හේතුවෙන් ඇති වු විනිමය අනුපාතයේ වු රු.3.00 වෙනස්වීම මත සැපයුම්කරු විසින් රු. 450,000 ක මුදලක් අමතරව ඉල්ලුම් කර තිබුණි.

## 4. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 4.1 අරමුදල් උපයෝජනය

ව්‍යාපෘතියේ අයවැයගත හා තත්‍ය වියදම් සැසදීමේදි පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ ක්‍රියාකාර සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය සඳහා රු.335,191,005 ක් වියදම් කිරීමට ප්‍රතිපාදනය කර තිබුණද , ව්‍යාපෘතිය විසින් වර්ෂය අවසානයේදි අදාළ කාර්යන්ට උපයෝජනය නොකළ රු.30,220,413 ක් හෝ සියයට 16.34 ක් නැවත මහා භාණ්ඩාගාරයට යවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදි ව්‍යාපෘති කාර්යන් 18 ක් සඳහා වෙන් කර තිබුණු මුළු එකතුව රු. 54,601,333 ක් වු මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණි.

(ඈ) කාර්යයන් 36 ක් සඳහා අයවැයෙන් ප්‍රතිපාදනය කර තිබු රු.182,690,020කින් 2012 දෙසැම්බර් 31 වන විට උපයෝජනය කර තිබුණේ රු.40,578,986 හෙවත් සියයට 22 ක් පමණි.

( ඇ) කාර්යයන් 15 ක් සඳහා අයවැය ප්‍රතිපාදනයන් ඉක්මවා රු.10,696,530 ක් වියදම් කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී ඇස්තමේන්තුගත ප්‍රතිපාදන නොමැතිව කාර්යයන් 04 ක් සඳහා රු.650,171 ක් වියදම් දරා තිබුණි.

5. <u>භෞතික කාර්ය සාධනය</u>

( අ ) <u>මැලේරියා රෝගීන් හදුනාගැනීම</u>

i. p. falciparum malaria රෝගය තුරන් කිරීමත් p. vivax malaria රෝගය සියයට 75ක් මර්දනය කිරීමත් ව්‍යාපෘතියේ මැලේරියා සංරචකයේ අරමුණ වේ. 2012 වර්ෂය තුළදී දේශීය මැලේරියා රෝගීන් 23ක්ද (p. vivax 19ක් හා p. falciparum 04ක්ද ) වෙනත් රටවලින් පැමිණි රෝගීන් සංඛ්‍යාව 64ක් ලෙසද වාර්තා වී තිබුණි.

( ආ ) Long Lasting Insecticide Net ( LLIN) බෙදාහැරීම

-----------------------------------------------------------

2011 හා 2012 වර්ෂවලදී මිලදී ගන්නා ලද LLIN (Olyset හා Yorkool යන වර්ග) 1,274,000න් 2012 දෙසැම්බර් 31 වන විට 1,135,600ක් බෙදාහැර තිබුණි.

ඒ සම්බන්ධයෙන් පහත සදහන් නිරීක්ෂණයන් කෙරේ.

i. 2012 දෙසැම්බර් 31 වන විට LLIN 138,400ක් බෙදා නොහැර ඉතිරිව තිබුණි.

ii. වැඩි අවදානමක් සහිත ජනගහනයකින් යුත් ප්‍රදේශවලට වඩා අඩු අවදානමක් සහිත ප්‍රදේශ සඳහා බෙදාහැරීම් සිදුකර තිබුණි.

නිදසුන් : නුවර, මාතලේ, හම්බන්තොට, යාපනය

iii බදුල්ල දිස්ත්‍රික්කය සඳහා වෙන්කර තිබු මදුරුදැල් ප්‍රමාණයට වඩා මදුරුදැල් 4,201 ක් වැඩිපුර බෙදාහැර තිබුණි.

iv. මිලදීගන්නා ලද Olyset හා Yorkool යන වර්ගයේ LLIN මදුරුදැල්වල සාම්පල වෛද්‍ය පර්යේෂණ ආයතනය වෙත යවා එම මදුරුදැල්වල ආලේපිත කාමිනාශක වලින් අපේක්ෂිත අරමුණ ඉටුවේද හා කෘමිනාශකයේ කල්පැවැත්ම පිලිබඳ පරීක්ෂා කළ අතර 2012 දෙසැම්බර් 24 දිනැති වෛද්‍ය පර්යේෂණ ආයතනයේ තත්ව පරීක්ෂණ වාර්තාව අනුව එම මදුරු දැල් පරීක්ෂා කිරීමෙන් ලද ප්‍රතිපල සතුටුදායක නොවන බව වාර්තා කර තිබුණි.

v මැලේරියා ප්‍රාදේශීය කාර්යාල මගින් බෙදාහැර තිබූ මදුරුදැල් සම්බන්ධව දත්ත සමූහයක් (Data Base) ව්‍යාපෘති කාර්යාලය මගින් පවත්වාගෙන ගොස් නොතිබූ බව නිරීක්ෂණය වූ අතර ඒ පිලිබඳ පසු විපරමක් කර නොතිබුණි.

( ඇ ) <u>පුහුණු වැඩසටහන්</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. 2012 වර්ෂයේ නිලධාරීන් සඳහා පැවැත්වීමට අපේක්ෂා කළ පුහුණු වැඩමුළු සංඛ්‍යාව 181 ක් වූ අතර සත්‍ය වශයෙන් පවත්වා තිබුණේ වැඩසටහන් 139 ක් පමණි

ii. 2012 වර්ෂයේ පුහුණු වැඩමුළු සඳහා සහභාගි කර ගැනීමට බලාපොරොත්තු වූ නිලධාරීන් සංඛ්‍යාව 6661 ක් වූ අතර සත්‍ය වශයෙන් සහභාගී වූ සංඛ්‍යාව 3172ක් විය. එනම් අපේක්ෂිත සංඛ්‍යාවෙන් සියයට 48 ක ප්‍රමාණයකි.

## 6. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) භාණ්ඩ ප්‍රසම්පාදනය
(ආ) තොග
(ඇ) අරමුදල් උපයෝජනය
(ඈ) අග්‍රිම හා අත්තිකාරම් නිරවුල් කිරීම
(ඉ) ගිණුම්කරණය